Department of Education Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය- ගණිතය

සතිය- 7

ශ්‍රේණිය-10

සැකැස්ම -G.U.D.කුමාර කෑ/දෙහි/ ගෝනගල ම. වි.

# 28 පාඩම - නිර්මාණ

## ත්‍රිකෝණ නිර්මාණය

**1. එක් එක් පාදයේ දිග දී ඇති විට**


$AB = 5$ cm ද $BC = 7$ cm ද $AC = 9$ cm ද වූ *ABC* ත්‍රිකෝණය නිර්මාණය කරන්න.

**පියවර 1** : 5 cmක් දිග රේඛා ඛණ්ඩයක් නිර්මාණය කර එය *AB* ලෙස නම් කරන්න.

**පියවර 2** : *B* කේන්ද්‍රය ලෙස ගෙන අරය 7 cmක් වූ වෘත්ත චාපයක් (ප්‍රමාණවත් දිගින් යුක්ත) අඳින්න.

**පියවර 3** : ඉහත පියවර 2 හි නිර්මාණය කළ වෘත්ත චාපය ඡේදනය වන සේ *A* කේන්ද්‍ර කරගෙන අරය සෙන්ටිමීටර 6ක් වූ තවත් වෘත්ත චාපයක් අඳින්න.

**පියවර 4** : වෘත්ත චාප දෙක ඡේදනය වූ ලක්ෂ්‍යය *C* ලෙස නම් කර *A* හා *C* ත් *B* හා *C* ත් යා කිරීමෙන් *ABC* ත්‍රිකෝණය සම්පූර්ණ කරන්න.





**2. පාද දෙකක දිග හා අන්තර්ගත කෝණයේ අගය දුන් විට**

$XY = 7$ cm ද $YZ = 5$ cm ද $X\hat{Y}Z = 60^0$ ද වූ *XYZ* ත්‍රිකෝණය නිර්මාණය කරන්න.

**පියවර 1** : $60^0$ක කෝණයක් නිර්මාණය කර එහි ශීර්ෂය *Y* ලෙස නම් කරන්න. මෙම කෝණයේ බාහුවල දිග දී ඇති පාදවල දිගවලට වඩා වැඩි විය යුතු ය.

පියවර 2 : මෙම කෝණයෙහි එක් බාහුවක් මත 6 cm දිග *XY* රේඛා ඛණ්ඩයකුත් අනෙක් බාහුව මත 7 cm දිග *YZ* රේඛා ඛණ්ඩයකුත් නිර්මාණය කරන්න. (රූපය බලන්න)

පියවර **3**: *X* හා *Z* යා කර *XYZ* ත්‍රිකෝණය සම්පූර්ණ කරන්න.




**3. කෝණ දෙකක අගය හා පාදයක දිග දුන් විට**


*AB* = 6.2 cm ද $A\hat{B}C = 60^0$ ද $B\hat{A}C = 90^0$ ද වූ ABC ත්‍රිකෝණය නිර්මාණය කරන්න.

පියවර 1 : 6.2 cm දිග රේඛා ඛණ්ඩයක් නිර්මාණය කර එය *AB* ලෙස නම් කරන්න.

පියවර 2 : *B* හි දී $A\hat{B}C = 60^0$ වන පරිදි කෝණයක් නිර්මාණය කරන්න.

පියවර 3 : *A* හි දී $B\hat{A}C = 90^0$ වන පරිදි කෝණයක් නිර්මාණය කරන්න.

**පියවර 4** : *BC* හා *AC* රේඛා ඡේදනය වන ලක්ෂ්‍යය *C* ලෙස නම් කරන්න.




- ගණිතය පෙළ පොතේ 119,120 පිටු වල 28.2 අභ්‍යාසයේ සියළු ගැටලු විසඳමු